**හක්මන ප්‍රාදේශීය සභාව**
**මාතර දිස්ත්‍රික්කය**
**-----------------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන
**-----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 ජූලි 22 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2015 ජූලි 29 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ජනවාරි 03 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ජේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට හක්මන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල වත්කම්, හිමිකම් හා වගකීම් වටිනාකම් ඉදිරිපත් කිරීමේ දෝෂයන් නිසා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ එම ශේෂවල එකතු වටිනාකම් අතර රු.5,540,360 ක වෙනසක් පැවතුණි.

(ආ) පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු ජංගම කුටි 10 ක වටිනාකම ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ කර්මාන්ත 05 ක් වෙනුවෙන් ණයගැති හා ණයහිමි ප්‍රතිපාදන ඇති නොකිරීම නිසා එම ශේෂ රු.912,598 ක් අඩුවෙන්ද, රෝනියෝ යන්ත්‍රයේ රු.212,800 ක් වූ වටිනාකම දෙවරක් ගිණුම්ගත වීම නිසා ස්ථාවර වත්කම් වටිනාකම සමාන අගයෙන් වැඩියෙන්ද දක්වා තිබුණි.

**1.3.2 නොසැසඳු පාලන ගිණුම්**

-----------------------------

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.9,264,112 ක් වූ ගිණුම් විෂයයන් 13 කට අදාළ ශේෂ හා ඊට අදාළ උපයෝගී ලේඛන/උපලේඛනවල දැක්වෙන ශේෂ අතර එකතුව රු.1,593,520 ක් වූ අසමානතා නිරීක්ෂණය විය.

**1.3.3 අවිනිශ්චිත ගිණුම**

---------------------

ඉකුත් වර්ෂය අවසානයට අවිනිශ්චිත ගිණුමේ වූ රු.873,211 ක හර ශේෂයට අදාළ ගැලපීම් කර ගිණුම් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදීත් පියවර ගෙන නොතිබුණි.

**1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

--------------------------------------

වර්ෂ 03 කට වඩා වැඩි කාලයක් ඉක්මවූ රු.227,740 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ 05 ක්ද, රු.366,245 ක් වූ ණයහිමි ශේෂ 42 ක්ද, රු.1,707,092 ක් වූ තැන්පතු ශේෂ 12 ක්ද පැවති අතර, එකී ශේෂ නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි.

**1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම**

--------------------------------------

එකතුව රු.178,465,076 ක් වූ වත්කම් සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනය සහ වාර්ෂික සමීක්ෂණ මණ්ඩල වාර්තාද, රු.17,889,176 ක් වූ විවිධ ණයගැති හා රු.22,840,763 ක් වූ විවිධ ණයහිමි ශේෂ සම්බන්ධයෙන් ණයගැති හා ණයහිමි ලේඛන හා උපලේඛනද, රු.2,707,033 ක් වූ දේශීය ණය හා සංවර්ධන අරමුදල් ශේෂය පිළිබඳ යාවත්කාලීන කරන ලද ලේඛනය හා ශේෂ සනාථද, එකතු වටිනාකම රු.1,453,791 ක් වූ තැන්පතු පිළිබඳව විස්තරාත්මක උපලේඛනද ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

**1.3.6 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම**

-----------------------------------------------------

අයවැයගත හා පරිපූරක සම්මත වැය සමග වැය විෂයයන්හි තථ්‍ය වියදම්, අතිරික්තතා හා ඌනතා පිළිබඳ හේතු දැක්වෙන ප්‍රකාශයක් 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහයේ 193 රීතිය පරිදි ගිණුම් සමඟ ඉදිරිපත් කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.1,177,140 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.5,453,698 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.6,630,838 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

### 2.2 විශ්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

-------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ

(අ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ වියදමේ සුළු අඩු වීමක් පෙන්නුම් කළද, මුළු පුනරාවර්තන ආදායමින් සියයට 97 ක් තරම් මුළු පුනරාවර්තන වියදම් පැවතින.

(ආ) සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ දෙක තුළ සභාවේ මුළු පුනරාවර්තන ආදායම් සහ ආදායම් ආධාර මෙන්ම ස්වයං උත්පාදන ආදායම් සහ මුළු පුනරාවර්තන වියදම් පිළිබඳ සාරාංශගත විස්තරයක් පහත දැක්වේ.

| වර්ෂය | මුළු පුනරාවර්තන ආදායම් | ආදායම් ආධාර | ස්වයං උත්පාදිත ආදායම් | මුළු පුනරාවර්තන වියදම් | ස්වයං උත්පාදිත ආදායම් ඉක්මවූ පුනරාවර්තන වියදම් |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| 2015 | 36,150,010 | 21,844,304 | 14,305,706 | 34,972,870 | (20,667,164) |
| 2014 | 31,264,785 | 13,170,344 | 18,094,441 | 36,718,483 | (18,624,042) |
| 2013 | 27,081,849 | 11,457,687 | 15,624,162 | 29,522,751 | (13,898,589) |

මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂයේදී සහ ඉකුත් වර්ෂ 02 ක තුළ සභාවේ ආදායම් ආධාරවල වර්ධනයක් පෙන්නුම් කරන නමුත්, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ස්වයං උත්පාදන ආදායම්වල රු.3,788,735 ක පිරිහීමක් දක්නට ලැබුණි.

(ii) සභාවේ ස්වයං උත්පාදන ආදායම ඉක්මවා ඉකුත් වර්ෂ 03 තුළ සැලකිය යුතු අගයකින් අඛණ්ඩව පුනරාවර්තන වියදම් වැඩිවී තිබුණද, වියදම් පාලනය කර ගැනීම සඳහා ප්‍රමාණවත් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(iii) ආදායම් ආධාර නොලැබෙන්නට සභාවේ ස්වයං උත්පාදන ආදායම් වලින් පුනරාවර්තන වියදම් ආවරණය කර ගැනීමට කිසිදු ආකාරයකින් හැකියාවක් නොලැබෙන බව පෙන්නුම් කරනු ලැබේ.

(iv) ඉහත අංක (i) සිට (iii) දක්වා ඡේදවල දැක්වෙන කරුණු අනුව ස්වයං උත්පාදන ආදායම් ඉහළ නංවා ගැනීමට සභාවේ අවධානය යොමුවිය යුතු බවත්, ඒ සඳහා විධිමත් වැඩපිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක කළයුතු බවත්, එසේ නොමැති වුවහොත් සභාවේ මූල්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් පවතින දුර්වලතාවය හේතුවෙන් ගැටළු සහගත තත්ත්වයක් උද්ගත වියහැකි බවත්, එමගින් අඛණ්ඩ පැවැත්මට අහිතකර බලපෑම් ඇතිවිය හැකි බවත් නිරීක්ෂණය විය.

## 2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයේදී ජංගම වත්කම් ඉක්මවූ ජංගම බැරකම් පැවතීම හේතුවෙන් කාරක ප්‍රාග්ධනය ඍණ අගයක් ගෙන තිබුණු අතර, මෙය මූල්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් යහපත් තත්ත්වයක් නොවීය.

## 2.4 ආදායම් පරිපාලනය

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

### 2.4.1 වරිපනම් බදු

(අ) ආරම්භක හිඟ ශේෂය රු.548,220 ක් වූ අතර, බිල්කිරීම් රු.364,798 ක් විය. හිඟයෙන් සියයට 44 ක් හා බිල්කිරීම් වලින් සියයට 66 ක් වර්ෂය තුළ අයකරගෙන තිබුණි. වර්ෂය අවසානයට පැවති හිඟ ශේෂ අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 (1) (අ) වගන්තිය ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

(ආ) ආරම්භක හිඟ අක්කර බදු ශේෂය රු.90,810 ක් වූ අතර, බිල් කිරීම් රු.7,790 ක් විය. ආරම්භක හිඟයෙන් සියයට 12 ක් සහ බිල්කිරීම් වලින් සියයට 39 ක් පමණක් අයවී තිබුණු නමුත්, හිඟ ශේෂ අයකර ගැනීම සඳහා1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 (1) (අ) වගන්තිය ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

### 2.4.2 කුලී ආදායම්

ආරම්භක හිඟ කුලී ශේෂය රු.275,212 ක් වූ අතර, බිල් කිරීම් රු.2,096,275 ක් විය. වර්ෂය තුළ රු.2,145,358 ක් අයකරගෙන තිබුණු අතර, වර්ෂය අවසානයට හිඟ ශේෂය රු.226,129 ක් විය.

**2.4.3 උසාවි දඩ සහ මුද්දර ගාස්තු**

--------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2015 දෙසැම්බර් 31 දිනට මුද්දර ගාස්තු වෙනුවෙන් රු.4,943,745 ක් හා උසාවි දඩ වෙනුවෙන් රු.356,273 ක් ලැබිය යුතුව තිබුණි.

**03. මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

**3.1 වත්කම් කළමනාකරණය**

-----------------------------

නිෂ්කාර්ය වත්කම්

----------------------

(i) නිශ්ක්‍රියව පවතින පිරිවැය රු.3,520,000 ක් වූ වාහන 09 ක් සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් නොගැනීම නිසා වාහන දිරායමින් පැවැතුණි.

(ii) 2010 මාර්තු 19 දින සභා අරමුදලින් මිලදීගෙන තිබුණු රු.130,862 ක් වූ කුට්ටි ගල් යන්ත්‍රය සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවැතුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

-------------------------------------

(අ) සේවක ණය

----------------

2014 වර්ෂයේදී නිලධාරීන් 04 දෙනෙකුට ලබාදී තිබුණු රු.300,405 ක් වූ හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මානව සම්පත් කළමනාකරණය

-------------------------------------

සේවක සංඛ්‍යා සැලැස්මේ අනුමත සංඛ්‍යාව ඉක්මවා 09 දෙනෙකු සේවයේ යොදවාගෙන තිබුණු නමුත්, එම තනතුරු විධිමත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) හඳුනාගත් පාඩු

------------------

කන්දෙගොඩ පාසල් හරස් මාර්ගයේ කුට්ටි ගල් ඇතිරීම හා ගංගොඩගම කලුවාගහහේන මාර්ගය සංවර්ධනය කිරීම යන කර්මාන්ත 02 ක වෙනුවෙන් රු.12,600 ක් වූ ප්‍රමාද ගාස්තු අයකර ගෙන නොතිබුණි.

## 04. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

----------------------------------------

### 4.1 අයවැය පාලනය

--------------------

සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනයේ ඇතුළත් ආදායම් විෂයයන් 05 ක් ළඟාකර නොගත් ඉලක්කගත ආදායම්වල එකතුව රු.34,473,265 ක් ද, වියදම් විෂයයන් 03 ක අනුමත සීමාවන් ඉක්මවා රු.12,159,263 ක් ද, වියදම් විෂයයන් 06 ක රු.8,133,203 ක් වූ ඉතිරිවීම්ද පැවතීම නිසා අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

### 4.2 අභ්‍යන්තර විගණනය

-------------------------

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 133 හා 134 හි දැක්වෙන විධිවිධානයන් සහ දකුණු පළාත් පාලන කොමසාරිස්ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/න.ව.ලේ දරන චක්‍රලේඛය ප්‍රකාර ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණු නමුත්, සභාව විසින් පත්කර තිබුණු අභ්‍යන්තර විගණන නිලධාරියාට සමාලෝචිත වර්ෂයේදී රු.389,755 ක වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි.

### 4.3 විගණන හා කළමනාකරණ කමිටුව

-----------------------------------------

2009 ජුනි 09 දිනැති අංක DMA/2009(i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටුව පිහිටුවීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලනය

-----------------------

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය